# කෘෂිකර්මය

## සමස්ත උපනතීන්

වර්ෂයේ මුල් භාගය තුළ අඛණ්ඩව පැවති දැඩි නියඟය හේතුකොටගෙන විශාල පසුබෑමක් පෙන්නුම් කළ කෘෂිකාර්මික අංශය 1992 වර්ෂය තුළ මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන ලදි. තේ නිෂ්පාදනය සියයට 26 ක තියුණු අඩුවීමක් වාර්තා කරන ලදි. රබර් නිෂ්පාදනය සියයට 1 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කළ අතර, පොල් නිෂ්පාදනයේ සියයට 9 ක වැඩිවීමක් සිදුවිය. මේ අතර වී නිෂ්පාදනය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 2 කින් අඩු විය. ලොකු ළූණු, රතු ළූණු සහ අර්තාපල් වැනි අතුරු ආහාර බෝග නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වැඩිවූ අතර, සීනි නිෂ්පාදනය 1992 වර්ෂයේදී සියයට 10 ක අඩුවීමක් පෙන්නුම් කරන ලදි. 1992 වර්ෂයේදී සුළු අපනයන බෝග වගාවන් රැසක නිෂ්පාදනයද වැඩිවී ඇත.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව තිබූ තේ, රබර් සහ පොල් වතු අංශයේ කළමනාකාරීත්වය 1992 ජූනි මාසයේදී පෞද්ගලීකරණය කිරීම වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණයක් විය. රාජ්‍ය අයිතිය යටතේ තිබූ වතු 502 කින් 449 ක් පෞද්ගලික කළමනාකරණ සමාගම් 22 කට භාරදෙන ලදි. ඵලදායිතාව වැඩිකිරීම, ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සහ වැවිලි අංශයේ පොදු කාර්‍ය පිරිවැය අඩුකිරීම, කළමනාකාරීත්වය පෞද්ගලීකරණය කිරීමේ අරමුණු වේ.

### ප්‍රධාන අපනයන බෝග

#### තේ

1991 වර්ෂයේ වාර්තා වූ තේ කිලෝග්‍රෑම් දශලක්ෂ 241 ක වාර්තාගත තේ නිෂ්පාදනය, 1992 වර්ෂයේදී කිලෝග්‍රෑම් දශලක්ෂ 179 ක් විය. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 26 ක අඩුවීමක් වන අතර, 1956 න් පසු වාර්තා ගත වූ අඩුම තේ නිෂ්පාදන මට්ටම විය. වර්ෂයේ මුල් භාගය තුළ පැවැති දැඩි නියඟකාරී තත්ත්වය මෙම අයහපත් නිෂ්පාදන ක්‍රියාකාරීත්වයට හේතුවිය. පෙර වර්ෂයට සාපේක්ෂව බලන විට මෙම අඩුවීම සියළු තේ බිම් අංශවලම සිදුවිය. 1991 වර්ෂයේදී සියයට 11 කින් වැඩිවී කිලෝග්‍රෑම් දශලක්ෂ 116 ක් වූ පහත් බිම් අංශයේ තේ නිපයුම 1992 වර්ෂයෙහිදී සියයට 25 කින් අඩුවී කිලෝග්‍රෑම් දශලක්ෂ 87 ක් බවට පත්විය. උස්බිම් හා මැදිබිම් තේ නිෂ්පාදනයද පිළිවෙලින් සියයට 27 කින් සහ සියයට 26 කින් අඩුවී කිලෝග්‍රෑම් දශලක්ෂ 54 ක් සහ කිලෝග්‍රෑම් දශලක්ෂ 38 ක් ලෙස වාර්තා කරන ලදි. වර්ෂ කීපයක් තුළ අඛණ්ඩව වැඩිවූ සී.ටී.සී. (කපා, ඉරා සහ අඹරන ලද) තේ නිෂ්පාදනය 1992 වර්ෂයේදී සියයට 23 කින් අඩුවී කිලෝග්‍රෑම් දශලක්ෂ 5.1 ක් ලෙස වාර්තා කරන ලදි. කලින් වර්ෂයේදී මෙන් 1992 වර්ෂයේදී සී.ටී.සී. තේ නිෂ්පාදනය මුළු නිෂ්පාදනයට සියයට 3 කින් පමණ දායක විය.


ජනවසම සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හෙක්ටයාර 94,541 ඇතුළත් තේ වතු 356 ක් වර්ෂය තුළදී පෞද්ගලික කළමනාකාරීත්ව සමාගම් වලට භාර දෙන ලදි. එසේම වර්ෂය තුළ එම රාජ්‍ය ආයතන දෙක තේ කම්හල් 312 ක්ද, පෞද්ගලික කළමනාකරණ සමාගම් වලට භාර දෙන ලදි.

1991 වර්ෂයේ තේ අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය, සියයට 11 කින් අඩුවී මෙට්‍රික් ටොන් 118,900 ක් වූ අතර, 1992 වර්ෂයේදී තවදුරටත් සියයට 8 කින් අඩුවී මෙට්‍රික් ටොන් 108,800 ක් විය. වර්ෂයේ මුල් භාගය තුළ පැවති දැඩි නියඟය සහ තේ මිළ ගණන් පහත මට්ටමක පැවතීම, 1992 වර්ෂය තුළ පොහොර භාවිතය අඩුවීමට හේතු විය.

1992 වර්ෂය තුළ තේ වගාව යටතේ ලියාපදිංචි කළ මුළු තේ බිම් ප්‍රමාණය හෙක්ටයාර 221,836 ක් විය. මෙය පසුගිය වර්ෂයට වඩා හෙක්ටයාර 145 ක වැඩිවීමකි. මුළු ලියාපදිංචි භූමි ප්‍රමාණයෙන් සියයට 28 ක් හෙවත් හෙක්ටයාර 61,371 ක් සුළු ඉඩම් හිමියන් යටතේ විය.

වර්ෂය තුළදී නැවත වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය සියයට 20 කින් අඩුවී හෙක්ටයාර 1,417 ක් වූ අතර, අලුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 31 කින් අඩුවී හෙක්ටයාර 1,386 ක් විය. නැවත වගා කිරීම් හා අළුතින් වගා කිරීම් කටයුතු සඳහා විවිධ බිම් ප්‍රදේශ අනුව දෙනු ලබන සහනාධාර ගෙවීම් 1992 වර්ෂය තුළදී ද නොවෙනස්ව පැවතුණි. අළුතින් වගා කිරීම සහ නැවත වගා කිරීම් සඳහා 1992 වර්ෂය තුළදී දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 32 ක් සහ රුපියල් දශ ලක්ෂ 39 ක් විය.

# ප්‍රධාන කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.9 සංඛ්‍යා සටහන

## තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1990 - 1992

| ශීර්ෂය | ඒකකය | 1990 | 1991(අ) | 1992(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 233.2 | 240.7 | 178.9 |
| 1.1 උස් බිම් | " | 76.1 | 73.2 | 53.7 |
| 1.2 මැදි බිම් | " | 51.9 | 51.3 | 37.9 |
| 1.3 පහත් බිම් | " | 105.1 | 116.2 | 87.3 |
| 2. තේ වගාව යටතේ ලියාපදිංචි කළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 222 | 222 | 222 |
| 3. පොහොර නිකුතුව | මෙට්‍රික් ටොන් දහස් | 134.1 | 118.9 | 108.8 |
| 4. නැවත වගා කිරීම් | හෙක්ටයාර | 1,586 | 1,773 | 1,417 |
| 5. මිළ | | | | |
| 5.1 කොළඹ (ශුද්ධ) | කි.ග්‍රෑ/රුපියල් | 65.72 | 57.13 | 60.51 |
| 5.2 අපනයන (නැ.වි.ස.) | " | 91.78 | 84.03 | 81.50 |
| 6. නිෂ්පාදන වියදම | " | 60.54 | 60.68 | 72.26 |
| 7. අපනයන | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 216.0 | 212.4 | 181.7 |
| 8. අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ | 19,823.3 | 17,866.8 | 14,893.4 |
| | (විගැහි දශ ලක්ෂ) | (364) | (316) | (241) |
| 9. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඇ) | | 4.4 | 3.4 | 2.2 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) වගා කිරීම් සහ සැකසුම් කටයුතු වල පමණි

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය:
ජාතික පොහොර ලේකම් කාර්යාලය:
ශ්‍රී ලංකා මහා බැංකුව.

1991 වර්ෂයේ තුන් ගුණයකට වඩා වැඩිවූ තේ කම්හල් සංවර්ධන සහනාධාර යෝජනා ක්‍රමය යටතේ දෙනු ලැබූ මුළු සහනාධාර ප්‍රමාණය 1992 වර්ෂයේදී සියයට 18 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 84 ක් බවට පත්විය.

සකස් කරන ලද තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1992 වර්ෂයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 72.26 ලෙස ඇස්තමේන්තු කර තිබිණි. මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 19 ක වැඩිවීමකි. අයහපත් කාලගුණික තත්ත්වය නිසා නිමැවුම අඩුවීම, නිෂ්පාදන පිරිවැයේ සැළකිය යුතු වැඩිවීම කෙරෙහි බලපාන ලදි.

1991 ජූනි මස සිට අඩුවන උපනතියක් දැක්වූ තේ මිළ ගණන් විශේෂයෙන් 1992 දෙවැනි භාගය තුළ තරමක මධ්‍යස්ථ මට්ටමකට පත්විය. ඒ අනුව කොළඹ තේ වෙන්දේසියේ සියළුම තේ වර්ගවල සාමාන්‍ය දළ මිල 1992 වර්ෂයේ සියයට 6 කින් වැඩිවී කිලෝග්‍රෑමය රුපියල් 61.75 ක් විය. කෙසේ වුවද 1991 වර්ෂයේ සියයට 8 කින් අඩුවූ තේ වල සාමාන්‍ය අපනයන (නැ.වි.ස) මිල 1992 වර්ෂයේ තවදුරටත් සියයට 3 කින් අඩුවී කිලෝග්‍රෑමයක් රුපියල් 81.50 ක් විය. තේ මිළ ගණන් අඩුවෙන් පැවති 1991 පසු භාගයේ සහ 1992 මුල් භාගය තුළ මිලදී ගත් තේ වල (නැ.වි.ස.) මිල මත වූ, පසුකාලීන බලපෑම කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් වැඩිවීමට එරෙහිව අපනයන (නැ.වි.ස.) මිල අඩුවීමට හේතු විය.

තේ කර්මාන්තයට සහනයක් සැපයීම සඳහා 1992 නොවැම්බර් මාසයේ අපනයන තීරු ගාස්තු තවදුරටත් අඩු කරන ලදි. 1992 දෙසැම්බර් 21 සිට බලපාන පරිදි සියළුම අපනයන තීරු ගාස්තු සහ තේ වටිනාකම මත අය කරනු ලැබූ අලෙවි බද්ද මුළුමනින්ම ඉවත් කරන ලදි. තේ වටිනාකම මත අය කරනු ලැබූ බද්ද ඉවත් කිරීමෙන්, ගුණාත්මක තේ නිෂ්පාදනය දිරිගැන්වීමට අපේක්ෂා කෙරේ. තේ සෙස් බද්ද 1992 වර්ෂයේ දී ද කිලෝග්‍රෑමයක් රුපියල් 2.00 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

වර්ෂය තුළ පැවති පහත වැටුණු මිල ගණන් පෙර නොවූ විරූ නියඟ තත්ත්වය නිසා දැඩි ලෙස පීඩාවට පත් කම්හල් හිමියන් සහ තේ වගා කරන්නන් සඳහා දීමනා නිදහස් කිරීමට, සළකා බලන වර්ෂය තුළ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් යෝජනා ක්‍රම කීපයක් ආරම්භ කරන ලදි. නියඟය බලපැවැත්වූ තේ ඉඩම්වල නැවත වගා කිරීමට සුළු ඉඩම් හිමියන්ට හෙක්ටයාරයකට රු. 10,000 බැගින් ගෙවීමට, වර්ෂය තුළදී තේ සඳහා වූ ස්ථායිකරණ අරමුදලින් රුපියල් දශලක්ෂ 42 ක් යොදා ගන්නා ලදි. තවද, නියඟ කාලය තුළදී ඵලදාව අඩුවීමෙන් පාඩු ලද සුළු තේ ඉඩම් හිමියන්ට පාඩු පියවා ගැනීමට තේ සෙස් අරමුදලින් රුපියල් දශලක්ෂ 85 ක මුදලක් ගෙවා දමන ලදි.

මිල ගණන් අඩුවීම සහ ලැබෙන තේ දළු ප්‍රමාණය අඩුවීම නිසා දැඩි කාරක ප්‍රාග්ධන ගැටළු වලට මුහුණදුන් පෞද්ගලික අංශයේ තේ කම්හල් හිමියන්ට ඊට සහනයක් වශයෙන් වාණිජ බැංකු සහ තේ තැරැව්කරුවන් මගින් රුපියල් දශලක්ෂ 450 ක විශේෂ ණය පහසුකමක් සපයන ලදි. මෙම ණය සඳහා වූ පොලී පිරිවැයෙන් සියයට 50 ක් තේ ස්ථායීකරණ අරමුදල විසින් දැරූ අතර මුළු පොළී සහනාධාරය රුපියල් දශලක්ෂ 100 ක් පමණ විය.

මේ අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අන්තර්ජාතික තේ වෙළෙඳ පොලේ ඉහළ ඉල්ලුම් ඇති සී.ටී.සී. තේ නිමැවුම වැඩිකිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ නව සී.ටී.සී කම්හල් ඉදිකිරීමේදී දැරිය යුතු පිරිවැයෙන් සියයට 70 ක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දරනු ලැබේ.

## රබර්

1992 වර්ෂයේ රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශලක්ෂ 105 ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 1 සුළු වැඩිවීමකි. වර්ෂයේ මුල් කාලයේ ඇතිවූ නියඟ තත්ත්වය සමඟ ජූනි සහ ජූලි මාසවල ඇති වූ අධික වර්ෂාව සමහර ප්‍රදේශවල පැවැති කිරි කපන්නන්ගේ හිඟය සහ ආර්ථික වශයෙන් ඵලදායි නොවන ඇතැම් රබර් ඉඩම් තෙත් කලාපයේ තේ සඳහා යොදා ගැනීමේ විවිධාංගීකරණ වැඩපිළිවෙල රබර් නිෂ්පාදනයේ දුර්වල ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑ සමහර සාධකයි.

තාක්ෂණිකව විශේෂණය කරන ලද රබර්, සෝල් ක්‍රේප් සහ වර්ගීකරණය නොකරන ලද වර්ගවල රබර් නිමැවුම 1992 වර්ෂයේදී වැඩිවිය. මුළු රබර් නිමැවුමට සියයට 17 ක් දායක වන තාක්ෂණිකව විශේෂණය කරන ලද රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශලක්ෂ 18 ක් වූ අතර, එය දෙගුණයකට වඩා වැඩිවීමක් පෙන්නුම් කරයි. සෝල් ක්‍රේප් රබර් නිමැවුම සියයට 20 කින් වැඩි වී කිලෝග්‍රෑම් දශලක්ෂ 3 ක් විය. එයට වෙනස්ව යමින්, පසුගිය වර්ෂය සමග සසඳන කල මුළු නිමැවුමට සියයට 42 කින් දායක වූ ෂීට් රබර් නිමැවුම සියයට 14 කින් අඩු වී කිලෝග්‍රෑම් දශලක්ෂ 44 ක් විය. එසේම ස්ක්‍රැප් ක්‍රේප් සහ ලේටෙක්ස් ක්‍රේප් නිමැවුම පිළිවෙලින් සියයට 20 කින් හා සියයට 10 කින් අඩුවී කිලෝග්‍රෑම් දශලක්ෂ 6 ක් සහ කිලෝග්‍රෑම් දශලක්ෂ 26 ක් විය.

1992 වර්ෂයේ රබර් වගා අංශය සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 12,700 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 7 ක අඩුවීමකි.

කිරි කැපීම යටතේ වූ ඉඩම් ප්‍රමාණය 1991 වර්ෂයේ හෙක්ටයාර 147,000 සිට හෙක්ටයාර 148,000 දක්වා සුළු වශයෙන් වැඩි වුවද, රබර් වගාව යටතේ මුළු ලියාපදිංචි ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 600 කින් සුළු වශයෙන් අඩුවී 1992 වර්ෂයේදී හෙක්ටයාර 197,900 ක් විය. මේ අතර හෙක්ටයාරයකට සාමාන්‍ය ඵලදාව 1991 වර්ෂයේ කිලෝග්‍රෑම් 706 සිට 1992 වර්ෂයේ කිලෝග්‍රෑම් 708 දක්වා සුළු වශයෙන් වැඩි වීමක් වාර්තා කරන ලදි.

සියළුම වර්ගයන්හී රබර්වල සාමාන්‍ය අපනයන (නැ.වි.ස.) මිල 1991 වර්ෂයේ කිලෝග්‍රෑමයක් රුපියල් 34.55 සිට 1992 වර්ෂයේ කිලෝග්‍රෑමයක් රුපියල් 37.65 දක්වා සියයට 9 කින් වැඩිවිය. 1992 වර්ෂයේ කොළඹ වෙන්දේසියේ ආර්.එස්.එස්. 1 සාමාන්‍ය මිල සියයට 24 කින් වැඩි වී කිලෝග්‍රෑමයක් රුපියල් 29.28 ක් වූ අතර ආර්.එස්.එස්. 2 සාමාන්‍ය මිල සියයට 26 කින් වැඩි වී කිලෝග්‍රෑමයක් රුපියල් 28.89 ක් විය.

## 1.10 සංඛ්‍යා සටහන

## රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1990-1992

| ශීර්ෂය | ඒකකය | 1990 | 1991(අ) | 1992(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 113.1 | 103.9 | 105.0 |
| 2. බිම් ප්‍රමාණය | | | | |
| 2.1 වගාව යටතේ ඇති | හෙක්ටයාර දහස් | 199.0 | 198.5 | 197.9 |
| 2.2 කිරි කැපීම යටතේ ඇති | | 146.3 | 147.0 | 148.2 |
| 3. එලදාව | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 773 | 706 | 708 |
| 4. පොහොර නිකුතුව | මෙට්‍රික් ටොන් දහස් | 22.2 | 13.7 | 12.7 |
| 5. නැවත වගා කිරීම | හෙක්ටයාර | 5,202 | 5,190 | 1,722 (ඇ) |
| 6. මිළ | | | | |
| 6.1. අපනයන (නැ.වි.ස) | කි.ග්‍රෑ / රුපියල් | 35.50 | 34.55 | 37.65 |
| 6.2. කොළඹ ආර්.ඇස්.ඇස්. නො. 1 | | 22.93 | 23.59 | 29.28 |
| 7. නිෂ්පාදන වියදම (ඈ) | | 17.92 | 19.11 | 20.50 |
| 8. අපනයන | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 86.8 | 76.4 | 78.6 |
| 9. දේශීය පරිභෝජනය | | 23.6 | 26.8 | 28.5 |
| 10. අපනයන ඉපැයීම් | රු.දශ ලක්ෂ | 3,080.2 | 2,641.2 | 2,959.9 |
| | (විගැහි දශ ලක්ෂ) | (57) | (47) | (48) |
| 11. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.1 | 1.0 | 1.0 |

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික.

(ඇ) පෞද්ගලික අංශය පමණි.

(ඈ) පෞද්ගලික අංශයේ වතුවල බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම.

(ඉ) වගාකිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන්: රබර් පාලන දෙපාර්තමේන්තුව; ජාතික පොහොර ලේකම් කාර්යාලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

රබර් අපනයන තීරු ගාස්තු 1992 නොවැම්බර් 7 දින සිට බලපවත්නා පරිදි සංශෝධනය කරන ලදි. සුළු රබර් ඉඩම් හිමියන්ට, වඩා හොඳ නිෂ්පාදන ආන්තිකයක් ලබාදීම සහතික කරනු වස් තීරුබදු අනුක්‍රම පරිමාණයෙහි සීමා මිල කිලෝග්‍රෑමයකට රුපියල් 2.00 කින් වැඩිවී කිලෝග්‍රෑමයකට රුපියල් 23.00 ක් විය. 1991 ඔක්තෝම්බර් මාසයේ සියයට 50 සිට සියයට 30 දක්වා අඩු වූ රබර් අපනයන බද්ද 1992 දෙසැම්බර් 22 සිට මුළුමනින්ම ඉවත් කරන ලදි.

සුළු රබර් ඉඩම් ඇතුළුව පෞද්ගලික රබර් නිෂ්පාදන අංශයේ නිෂ්පාදන පිරිවැය 1991 වර්ෂයේදී කිලෝග්‍රෑමයක් රුපියල් 19.11 සිට 1992 වර්ෂයේදී කිලෝග්‍රෑමයක් රුපියල් 20.50 දක්වා සියයට 7 කින් වැඩි විය.

රබර් පාලන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, රබර්වල දේශීය පරිභෝජනය 1992 වර්ෂයේ සියයට 6 කින් වැඩි වී කිලෝග්‍රෑම් දශලක්ෂ 28.5 ක් විය. මෙය වර්ෂය තුළ මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 27 ක් විය. රබර් ආශ්‍රිත කර්මාන්තවල ඇති වූ ප්‍රසාරණය රබර් පරිභෝජන මට්ටම වැඩිවීම කෙරෙහි හේතු විය.

## පොල්

1991 වර්ෂයේ සියයට 14 කින් පහත වැටුණු පොල් නිෂ්පාදනය 1992 වර්ෂයේ සියයට 9 කින් වැඩි වී ගෙඩි දශලක්ෂ 2,380 ක් විය. 1991 වර්ෂයේ පැවැති යහපත් දේශගුණික තත්ත්වය නිසා ඇති වූ පසුකාලීන බලපෑම පොල් නිමැවුමේ වැඩිවීමට හේතු විය.

### 1.11 සංඛ්‍යා සටහන

### පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1990 - 1992

| ශීර්ෂය | ඒකකය | 1990 | 1991(අ) | 1992(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ඇ) | ගෙඩි දශ ලක්ෂ | 2,532 | 2,184 | 2,380 |
| 1.1 කපාපු පොල් | ගෙඩි දශ ලක්ෂ (ඈ) | 376 | 335 | 365 |
| 1.2 පොල් තෙල් | ගෙඩි දශ ලක්ෂ (ඈ) | 598 | 260 | 344 |
| 1.3 කොප්පරා (ඉ) | ගෙඩි දශ ලක්ෂ (ඈ) | 36 | 38 | 28 |
| 1,4 පොල් ගෙඩි අපනයනය | ගෙඩි දශ ලක්ෂ | 22 | 24 | 23 |
| 1.5 දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඊ) | ගෙඩි දශ ලක්ෂ | 1,530 | 1,552 | 1,620 |
| 2. සාමාන්‍ය අපනයන මිළ (නැ.වි.ස) (උ) | ගෙඩිය/රුපියල් | 3.63 | 4.54 | 6.61 |
| 3. පොහොර නිකුතුව | මෙ.ටො. දහස් | 27.8 | 28.8 | 33.8 |
| 4. නිෂ්පාදන වියදම | ගෙඩිය/රුපියල් | 1.11 | 1.70 | 1.97 |
| 5. නැවත වගාව/යටි වගාව (ඌ) | හෙක්ටයාර | 2,724 | 2,057 | 1,589 |
| 6. නව වගාව (ඌ) | හෙක්ටයාර | 1,120 | 1,009 | 637 |
| 7. අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ | 2,783 | 2,619 | 3,691 |
| | (විගැහි දශ ලක්ෂ) | (51) | (46) | (60) |
| 7.1 මද ආශ්‍රිත නිෂ්පාදන (උ) | රුපියල් දශ ලක්ෂ | 1,843 | 1,769 | 2,665 |
| | (විගැහි දශ ලක්ෂ) | (34) | (31) | (43) |
| 7.2 අනෙකුත් නිෂ්පාදන | රුපියල් දශ ලක්ෂ | 941 | 850 | 1,026 |
| | (විගැහි දශ ලක්ෂ) | (17) | (15) | (17) |
| 8. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (එ) | | 1.9 | 2.5 | 3.0 |

මූලයන්: පොල් වගා කිරීමේ මණ්ඩලය;
පොල් සංවර්ධන අධිකාරිය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත.

(ආ) තාවකාලිකයි

(ඇ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ.)

(ඈ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදාගත් අනුපාතිකයන්:
කපාපු පොල් මෙ.ටො. 1 = ගෙඩි 6,800
පොල් තෙල් මෙ.ටො. 1 = ගෙඩි 8,000
කොප්පරා මෙ.ටො. 1 = ගෙඩි 4,925

(ඉ) අපනයන පමණි.

(ඊ) ඒකපුද්ගල ගෘහ පරිභෝජනය වසරකට ගෙඩි 90 ලෙස ගණන් බලා ඇත. 1991 සිට ඒකපුද්ගල වාර්ෂික පරිභෝජනය පොල් ගෙඩි 94.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල්ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුළත් නොවේ.

(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.

(ඌ) විස්තරාත්මක තොරතුරු ලබාගත නොහැකි බැවින් හෙක්ටයාර 0.4 ට අඩු කුඩා පොල් ඉඩම්වල කරගෙන යනු ලබන වගා කටයුතු පිළිබඳ විස්තර මෙයට ඇතුළත් නොවේ.

(එ) වගා කිරීම සහ සැකසුම් කටයුතුවල පමණි.

කපාපු පොල් නිෂ්පාදනයේ ගෙඩි සමානය 1991 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 335 සිට 1992 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 365 දක්වා සියයට 9 කින් වැඩි වූ අතර, පොල්තෙල් නිෂ්පාදිතයේ ගෙඩි සමානය 1991 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 260 සිට 1992 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 344 දක්වා සියයට 32 කින් වැඩිවිය. කෙසේ වුවද, 1991 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 38 ක් වූ කොප්පරා අපනයනයේ ගෙඩි සමානය 1992 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 28 දක්වා සියයට 26 කින් අඩු විය. එසේම 1992 වර්ෂයේ පොල් ගෙඩි අපනයනය සියයට 4 කින් අඩු වී ගෙඩි දශලක්ෂ 23 ක් විය.

පසුගිය වර්ෂයේදී මෙන් විවිධ සහනාධාර ක්‍රම යටතේ සිදු කරන ලද පොල් වගා කටයුතුවල පසුබැස්ම 1992 වර්ෂයේදී ද දක්නට ලැබුණි. පොල් පුනරුත්ථාපන ඉඩම් ප්‍රමාණය 1992 වර්ෂයේදී සියයට 6 කින් අඩුවී හෙක්ටයාර 2,873 ක් විය.

පසුගිය වර්ෂයේ සියයට 10 කින් අඩු වූ අළුතින් පොල් වගා කරන ලද බිම් ප්‍රමාණය 1992 වර්ෂයේදී තවදුරටත් සියයට 37 කින් පහත බැස හෙක්ටයාර 637 ක් විය. 1991 වර්ෂයේ සියයට 24 කින් අඩු වූ යටි වගාව යටතේ සහ නැවත වගාව යටතේ වගා කරන ලද බිම් ප්‍රමාණය 1992 වර්ෂයේදී සියයට 23 කින් තවදුරටත් අඩු වී හෙක්ටයාර 1,590 ක් විය. වර්ෂයේ මුල් භාගයේ ඇති වූ දරුණු නියඟ තත්ත්වය පොල් වගා කටයුතුවල පසුබැස්ම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය.

පසුගිය වර්ෂයේ සියයට 35 කින් වැඩි වූ තෘණ වර්ග අතුරු වගා කරන ලද පොල් ඉඩම් ප්‍රමාණය 1992 වර්ෂයේදී ද තවදුරටත් සියයට 30 කින් වැඩි වී හෙක්ටයාර 35 ක් විය. කෙසේ වුවද පොල් ඉඩම්වල අතුරු වගාවක් ලෙස ඇති කෝපි සහ ගම්මිරිස් ඉඩම් ප්‍රමාණය වර්ෂය තුළ පිළිවෙලින් සියයට 88 කින් සහ සියයට 60 කින් සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවී හෙක්ටයාර 5 ක් සහ හෙක්ටයාර 33 ක් විය.

1991 වර්ෂයේ සියයට 22 කින් වැඩි වූ පොල් අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය 1992 වර්ෂයේදීද තවදුරටත් සියයට 17 කින් ඉහළ ගොස් මෙට්‍රික් ටොන් 33,800 ක් විය. කෙසේ වුවද, පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොහොර ගබඩා මගින් නිකුත් කරනලද පොහොර ප්‍රමාණය සලකා බලන වර්ෂය තුළ සියයට 9 කින් අඩුවී මෙට්‍රික් ටොන් 1,876 ක් විය. පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය පැල තවාන් සංඛ්‍යාව 1991 වර්ෂයේ 33 සිට 1992 වර්ෂයේ 27 දක්වා අඩු විය. කෙසේ වුවද, වර්ෂය තුල පොල් පැල නිකුතුව සියයට 23 කින් වැඩි වී පොල් පැල දශ ලක්ෂ 1.62 ක් විය.

1991 වර්ෂයේ සියයට 57 කින් ඉහළ ගිය කොළඹ වෙළෙඳපොලේ සාමාන්‍ය පොල් මිල 1992 වර්ෂයේ තවදුරටත් සියයට 33 කින් වැඩි වී ගෙඩියක් රුපියල් 4.25 ක් විය. ප්‍රධාන පොල් මද නිෂ්පාදන වර්ග තුනෙහි සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) පෙර වර්ෂයේ සියයට 33 කින් වැඩි වූ අතර, 1992 වර්ෂයේ තවදුරටත් සියයට 46 කින් වැඩි වී 1991 වර්ෂයේ පොල් ගෙඩියක් රුපියල් 4.54 සිට 1992 වර්ෂයේ පොල් ගෙඩියක් රුපියල් 6.61 දක්වා වැඩිවිය. 1992 වර්ෂයේ පොල් ගෙඩියක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය රුපියල් 1.97 ක් ලෙස ඇස්තමේන්තු කර තිබෙන අතර, එය කලින් වර්ෂයට වඩා සියයට 16 ක වැඩිවීමකි.

කපාපු පොල් මෝල් සංවර්ධන වැඩපිළිවෙල යටතේ, නවීන යන්ත්‍රසූත්‍ර හා උපකරණ සවිකිරීම සඳහා සෙස් අරමුදලින් සහ පොල් මෝල් සංවර්ධන අරමුදලින්, මෝල් හිමියනට නොකඩවා මෙම වර්ෂයේදී ද ආධාර කරන ලදි. 1992 දෙසැම්බර් 21 දින සිට බලපාන පරිදි පොල් නිෂ්පාදිත මත වූ සියළුම අපනයන බදු අහෝසි කරන ලදි.

## වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන

### සුළු අපනයන බෝග

කුළු බඩු මෙන්ම පාන වර්ග හා සම්බන්ධිත බෝග වර්ග සමූහයකින්, සුළු අපනයන බෝග සමන්විත වේ. මෙම බෝග බොහොමයක් ගෙවතුවල සහ කුඩා වතුවල මිශ්‍ර බෝග වශයෙන් වගා කරයි. එහෙයින්, එම වගාවන් යටතේ ඇති නියම බිම් ප්‍රමාණයන් මෙන්ම නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබඳව නිවැරදි දත්ත ලබා ගැනීම අපහසු වී ඇත. කෙසේ වුවද, මෙම බෝග නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක්, අපනයනය කරනු ලබන බැවින් අපනයන පරිමාවන් මෙම බෝගයන්හී නිෂ්පාදන ප්‍රමාණයට ආදේශකයක් ලෙස සලකනු ලැබේ. සුළු අපනයන

බෝග නිෂ්පාදනයෙන් දේශීය පරිභෝජනයට ගැනෙන ප්‍රමාණය සහ තොග වෙනස්වීම් සැලකිය යුතු තරම් නොවේ යැයි මෙහිදී උපකල්පනය කරන බැවින් එම බෝග නිෂ්පාදනයන්හී ඇස්තමේන්තු බොහෝදුරට දළ අගයන් දක්වයි.

අපනයන දත්තයන්ට අනුව, 1992 වර්ෂයේදී කොකෝවා හැර අනෙකුත් වැදගත් සුළු අපනයන බෝගයන් බොහොමයක නිෂ්පාදන පසුගිය වර්ෂය හා සසඳන විට වැඩි වී ඇත. අනිකුත් සුළු අපනයන බෝගයන් සමග ගත් කල කුරුඳු වැඩිම අපනයන පරිමාවක් වාර්තා කරන ලදි. 1992 වර්ෂයේදී කුරුඳු මෙට්‍රික් ටොන් 10,408 ක් අපනයනය කල අතර, පසුගිය වර්ෂයේ අපනයනය කෙරුණු මෙට්‍රික් ටොන් 10,185 සමහ සසඳා බලන කල එය සියයට 2 ක වැඩිවීමකි. කෝපි, ගම්මිරිස් සහ කරාබුනැටි අපනයන පරිමාවද 1992 වර්ෂයේදී පිළිවෙලින් සියයට 8 කින්, සියයට 9 කින් සහ සියයට 7 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 3,608 ක්, මෙට්‍රික් ටොන් 2,506 ක්, මෙට්‍රික් ටොන් 1,395 ක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, කොකෝවා අපනයන පරිමාව සියයට 3 ක අඩු වීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 1,308 ක් විය.

පසුගිය වර්ෂය හා සසඳන විට, 1992 වර්ෂයේදී සුළු අපනයන බෝග අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය සියයට 35 ක අඩු වීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 7,200 ක් විය. වර්ෂය තුළදී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පොහොර භාවිතය දිරිගැන්වීම සඳහා තෝරා ගත් ප්‍රධාන අපනයන බෝග හතරක් වන ගම්මිරිස්, කෝපි, කොකෝවා හා කුරුඳු මුල් කරගෙන පොහොර ආදර්ශණ ක්‍රමය ක්‍රියාත්මක කරන ලදි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ යටතේ නිකුත් කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,497 කි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සපයන ලද දත්තයන්ට අනුව, ප්‍රධාන අපනයන බෝගයන් වගා කරන බිම් ප්‍රමාණය 1992 වර්ෂයේදී සියයට 1 කින් වැඩි වී හෙක්ටයාර 66,899 ක් විය. 1992 වර්ෂයේ ගම්මිරිස් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය සමහ පසුගිය වර්ෂයේ වගා කරන ලද බිම් ප්‍රමාණය සසඳන කල සියයට 5 කින් පුළුල් වී හෙක්ටයාර 10,502 ක් විය. සලකා බලන වර්ෂය තුළදී කොකෝවා, කෝපි සහ කරාබුනැටි යන බෝගයන් වගා කරන ලද බිම් ප්‍රමාණයන්හි සුළු වැඩිවීමක් පෙන්විණි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සුළු අපනයන බෝගවල වගා කටයුතු දියුණු කිරීම සඳහා සිය පිහිටාධාර යෝජනා ක්‍රමය 1992 දී ද නොකඩවා ක්‍රියාත්මක කරන ලදි. කෙසේවුවද සුළු අපනයන බෝග පිහිටාධාර යෝජනාක්‍රමය යටතේ 1992 වර්ෂයේදී වගා කටයුතුවල පහත වැටීමක් සිදු විය. මේ යෝජනා ක්‍රමය යටතේ අළුතින් වගා කරන ලද සහ නැවත වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය 1992 වර්ෂයේදී පිළිවෙලින් සියයට 39 ක් සහ සියයට 33 ක් අඩු වී පිළිවෙලින් හෙක්ටයාර 671 ක් සහ හෙක්ටයාර 76 ක් විය. පසුගිය වර්ෂය සමහ සසඳන කල, 1992 වර්ෂයේදී අළුතින් වගා කරන ලද කෝපි, ගම්මිරිස් සහ කොකෝවා බිම් ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 49 කින්, සියයට 36 කින් සහ සියයට 6 කින් පහත වැටුණි. පුනරුත්ථාපනය කරන ලද කුරුඳු බිම් ප්‍රමාණය 1991 දී හෙක්ටයාර 542 සිට සියයට 12 ක අඩු වීමක් වාර්තා කරමින් 1992 දී හෙක්ටයාර 476 ක් විය. මේ අතර සැලකිල්ලට භාජනය වන කාලය තුළ පුනරුත්ථාපනය කරන ලද කොකෝවා බිම් ප්‍රමාණය හෙක්ටයාර 19 සිට හෙක්ටයාර 31 දක්වා සියයට 67 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. සුළු අපනයන බෝග පිහිටාධාර යෝජනා ක්‍රමය යටතේ, 1992 වර්ෂයේදී ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය සියයට 18 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 20 ක් විය.

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරයෙන් 1989 වර්ෂයේදී ආරම්භ කරන ලද මැද රට බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය 1992 වර්ෂයේදී කෑගල්ල, මහනුවර, මාතලේ, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල නොකඩවා ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමයෙන් කුළුබඩු, පළතුරු සහ පානවර්ග ඇතුලත් බෝගයන් වන ගම්මිරිස්, සාදික්කා, කොකෝවා, කෝපි සහ කරදමුංගු ඇතුළු බහු වාර්ෂික බෝගයන්හි වාණිජමය නිෂ්පාදන සහ තොග අලෙවි පහසුකම් දියුණු කිරීමට අදහස් කරයි. එමෙන්ම අස්වැන්න නෙලා ගැනීමෙන් පසු ඒවා පවත්වාගෙන යාම සහ සකස් කිරීම පිළිබඳ නූතන ශිල්පීය ක්‍රම හඳුන්වා දීමටද බලාපොරොත්තු වේ.

වී

ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු වලට අනුව 1992 වර්ෂයේ වී නිෂ්පාදනය පසුගිය වර්ෂය සමහ සසඳන කල සියයට 2 කින් අඩු වෙමින් මෙට්‍රික් ටොන්

දශලක්ෂ 2.34 (වී බුසල් දශලක්ෂ 112) ක් විය. 1992 යල කන්නයේ වී නිෂ්පාදනය සියයට 15 කින් පහත වැටීම, 1992 වර්ෂයේ මුළු වී නිෂ්පාදනය පහත වැටීමට හේතු විය. වසරේ මුල් කාලය තුල පැවති නියං තත්ත්වය හේතුකොටගෙන විශේෂයෙන් යල කන්නය තුළ වපුරන ලද දළ බිම් ප්‍රමාණය සහ අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය සැළකිය යුතු ලෙස අඩුවීම වර්ෂය තුළ වී නිෂ්පාදනයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි දැඩි ලෙස බලපෑවේය.

1991/92 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.63 ක් (බුසල් දශලක්ෂ 78) ක් ලෙස ගණන් බලා ඇත. එය පසුගිය වසරේ මහ කන්නයේ නිෂ්පාදනයට වඩා සියයට 5 ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත. හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාවෙහි අඩුවීමක් තිබියදීත් වපුරන ලද සහ අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය වැඩිවීම මහ කන්නයේ තිමැවුම වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. පසුගිය වර්ෂයේ මෙන් මෙවර ද වැඩිම නිෂ්පාදන මට්ටමක් වාර්තා කළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 224,000 ක් විය. එය සමස්ත වී නිෂ්පාදනයෙන් සියයට 14 කට ආසන්න විය.

## 1.12 සංඛ්‍යා සටහන

### වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1991 - 1992

| ශීර්ෂය | ඒකකය | 1991(අ) | | | 1992(ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 501 | 316 | 817 | 548 | 255 | 803 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශ ලක්ෂ | 512 | 222 | 734 | 484 | 134 | 618 |
| අස්වැන්න කපාගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 483 | 308 | 791 | 523 | 243 | 766 |
| හෙක්ටයාරයක ඵලදාව (ඇ) | කිලෝග්‍රෑම් | 3,620 | 3,048 | 3,398 | 3,512 | 3,252 | 3,428 |
| අස්වැන්න කපාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 429 | 274 | 703 | 464 | 218 | 682 |
| නිෂ්පාදනය | මෙට්‍රික් ටොන් දහස් | 1,554 | 835 | 2,389 | 1,630 | 710 | 2,340 |
| | (බුසල් දහස්) | (74,485) | (39,986) | (114,471) | (78,155) | (34,029) | (112,184) |
| සහතික මිළ ක්‍රමය යටතේ මිළදී ගැනීම් (ඉ) | මෙට්‍රික් ටොන් දහස් | 44 | - | 44 | 6 | 1 | 7 |
| සහල් ආනයන | මෙට්‍රික් ටොන් දහස් | - | - | 132 | - | - | 210 |
| (වී සමානය) | (මෙට්‍රික් ටොන් දහස්) | (-) | (-) | (189) | (-) | (-) | (300) |

මූලයන්: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව;
කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව;
කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය;
වී අලෙවි මණ්ඩලය;
ශ්‍රී ලංකා රේගුව;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත

(ආ) තාවකාලිකයි

(ඇ) පොහොර නිකුත් කිරීම, වගා වර්ෂය තුළදී සහ ලිත් වර්ෂය තුළදී එකිනෙකට වෙනස් වේ. වගා වර්ෂය මහ (සැප්තැම්බර්/ඔක්තෝම්බර්-මාර්තු/අප්‍රේල්) සහ යල (අප්‍රේල්/මැයි-අගෝස්තු/සැප්තැම්බර්) කන්න වලින් යුක්ත වේ.

(ඈ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොට ගත් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තෝරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදව ගණනය කරන ලදි. මුළු වී නිෂ්පාදනය අස්වනු නෙලා ගත් ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදි.

(ඉ) මහ කන්නයේ අස්වැන්න ජනවාරි-ජූලි කාලච්ඡේදය තුළ මිළදී ගත් අතර, යල කන්නයේ අස්වැන්න අගෝස්තු-දෙසැම්බර් කාලච්ඡේදය තුළ මිළදී ගන්නා ලදී.

1991 යල කන්නයේ වී නිෂ්පාදනය සියයට 6 කින් අඩු වූ අතර, එය 1992 වර්ෂයේදී තව දුරටත් සියයට 15 කින් අඩුවී මෙට්‍රික් ටොන් දශලක්ෂ 0.71 ක් (වී බුසල් දශලක්ෂ 34) ලෙස වාර්තා විය. වර්ෂයේ මුල් කාලය තුළ පැවති දැඩි නියං තත්ත්වය හේතුකොටගෙන වගා කරන ලද සහ අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් යල කන්නයේ වී නිෂ්පාදනය පහත වැටිණි. කෙසේ වුවද, පසුගිය වර්ෂයේ හෙක්ටයාරයක සාමාන්‍ය එලදාවට වඩා 1992 යල කන්නයේ හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව ඉහළ මට්ටමක පැවතුණි.

1992 වර්ෂයෙහි හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව, කිලෝග්‍රෑම් 3,428 ක් ලෙස ගණන් බලා ඇති අතර, එය පසුගිය වර්ෂයට වඩා සුළු වැඩිවීමක් වාර්තා කරන ලදි. පසුගිය වසර සමඟ සසඳන විට 1991/92 මහ කන්නයේ හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව සියයට 3 කින් අඩුවී කිලෝග්‍රෑම් 3,512 ක් විය. මේ අතර 1992 යල කන්නයේ හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව සියයට 7 කින් වැඩිවී කිලෝග්‍රෑම් 3,252 ක් විණි. පසුගිය වර්ෂයේ දෙවැනි තැනට පත්වූ උඩවලවේ කලාපය නැවතත් මහ කන්නයේ ඉහළම හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව ලෙස කිලෝග්‍රෑම් 5,005 වාර්තා කරමින් පළමු ස්ථානයට ඒමට සමත් විය මහවැලි "එච්" කලාපය දෙවැනි තැනට පත් විය. උඩවලවේ කලාපය නොකඩවා හත්වැනි වරටත් යල කන්නයේ හෙක්ටයාරයකට ඉහළම සාමාන්‍ය එලදාව වාර්තා කිරීමට සමත් විය.

1991/92 මහ කන්නයේ වර්ෂා පෝෂිත ප්‍රදේශයන්හි සාමාන්‍ය එලදාව සියයට 3 කින් වැඩි වුවද, ප්‍රධාන වාරිමාර්ග සහිත ප්‍රදේශවල සහ සුළු වාරිමාර්ග සහිත ප්‍රදේශවල සාමාන්‍ය එලදාව හෙක්ටයාරයකට, පිළිවෙලින් සියයට 3 කින් සහ සියයට 12 කින් අඩු විය. පසුගිය වර්ෂයේ යල කන්නය සමඟ සසඳන කල, 1992 යල කන්නයේ වාරිමාර්ග කාණ්ඩ තුනෙහිම හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව වැඩි විණි. 1992 යල කන්නයේදී වර්ෂා පෝෂිත ප්‍රදේශයන්හි හා සුළු වාරිමාර්ග ප්‍රදේශයන්හි හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව පිළිවෙලින් සියයට 22 කින් සහ සියයට 9 කින් වර්ධනය විය. ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවල යල කන්නයේ හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව සුළු වශයෙන් වැඩිවීමක් වාර්තා කරන ලදි.

පසුගිය වර්ෂයෙහි සියයට 5 ක අඩුවීමක් පෙන්නුම් කළ වී වපුරන ලද මුළු දළ බිම් ප්‍රමාණය 1992 වර්ෂයේදී තවදුරටත් සියයට 2 කින් පහත වැටී හෙක්ටයාර 803,250 ක් විය. 1991/92 මහ කන්නයේ වපුරන ලද මුළු දළ බිම් ප්‍රමාණය සියයට 10 කින් වැඩිවී හෙක්ටයාර 548,190 ක් වූ අතර, යල කන්නයේ වී වපුරන ලද මුළු දළ බිම් ප්‍රමාණය සියයට 19 කින් පහත වැටී හෙක්ටයාර 255,060 ක් විය.

1991 වර්ෂයෙහි සියයට 5 ක පහත වැටීමක් පෙන්නුම් කළ අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය, 1992 වර්ෂයේදී තවදුරටත් සියයට 3 ක අඩුවීමක් වාර්තා කරමින් හෙක්ටයාර 766,106 ක් විය. කෙසේ වුවද, 1991/92 මහ කන්නයේදී අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය සියයට 8 කින් වැඩිවී හෙක්ටයාර 522,786 ක් වූ අතර, යල කන්නයේ අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය සියයට 21 ක සැලකිය යුතු අඩුවීමක් සිදු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අස්වැන්න නෙලා ගන්නා ලද සමස්ත බිම් ප්‍රමාණය අඩුවිය. 1990/91 මහ කන්නයේ වගා හානි ප්‍රමාණය සියයට 4 ක පසුබෑමක් පෙන්නුම් කළ ද, 1991/92 මහ කන්නයේ වගා හානි ප්‍රමාණය සියයට 5 කින් වැඩි විය. 1991 වර්ෂයේ යල කන්නයෙහි වාර්තා වූ සියයට 3 ක වගා හානි ප්‍රමාණය 1992 යල කන්නයේදී සියයට 5 දක්වා වැඩිවිය.

ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දත්තයන්ට අනුව, 1992 වර්ෂයේදී වී වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන්. 193,000 ක් විය. මෙය පසුගිය වසරෙහි නිකුත් කළ ප්‍රමාණයට වඩා සියයට 8 ක වැඩිවීමකි.

1992 වසරේදී වී අලෙවි මණ්ඩලය මගින් සහතික මිල යෝජනා ක්‍රමය යටතේ මිලදී ගන්නා ලද වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 7,000 කට සීමා විය. මෙය වසරෙහි මුළු වී නිෂ්පාදනයෙන් සියයට 1 කටත් වඩා අඩුවිය. රුපියල් 136 ක් වූ වී බුසලක සහතික මිල 1992 වර්ෂයේදී ද නොවෙනස්ව පැවතිණ.

නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ 1991 වර්ෂයේදී වී වගා අංශය සඳහා ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණය දෙගුණයකට වඩා වැඩිවීමක් වාර්තා කළද, 1992 වර්ෂයේදී එය සියයට 16 කින් අඩුවී රුපියල් දශලක්ෂ 618 ක් විය. 1991/92 මහ සහ 1992 යල යන දෙකන්නය සඳහා කෘෂිකාර්මික භාරකාර අරමුදල මගින් ප්‍රදානය කරන ලද මුළු ණය මුදල

රුපියල් දශලක්ෂ 49 කි. මෙය පසුගිය වර්ෂයේ ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණයට වඩා සියයට 16 ක අඩුවීමකි. 1992 යල කන්නයේ සිට කෘෂිකාර්මික භාරකාර අරමුදල, වර්ෂාපෝෂිත සහ සුළු වාරිමාර්ග ප්‍රදේශවල ගොවි ජනතාවගේ අවශ්‍යතාවයන් උදෙසා සිය අවධානය සීමා කිරීමට තීරණය කරන ලදි.

පසුගිය වර්ෂයේ සහල් ආනයනය සමඟ සසඳන විට, 1992 වර්ෂය තුළ සහල් ආනයනය සියයට 59 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 210,000 ක් විය.

## සීනි

1991 වර්ෂයේ මෙට්‍රික් ටොන් 66,450 ක උපරිම නිෂ්පාදන මට්ටමක් වාර්තා කළ සීනි නිෂ්පාදනය 1992 වර්ෂයේදී සියයට 10 කින් අඩු වී මෙට්‍රික් ටොන් 59,700 ක් විය. වර්ෂය තුළ පැවැති දැඩි නියඟකාරී තත්ත්වය නිසා මිරිකනු ලැබීම පිණිස ලැබුණු උක් දඬු ප්‍රමාණය පහත වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් සීනි නිෂ්පාදනයේ සැලකියයුතු අඩුවීමක් සිදු විය. නිෂ්පාදනයේ අඩුවීම වැඩි වශයෙන් පිළිබිඹු වූයේ පැල්වත්ත සීනි කම්හලේ නිමැවුම 1991 වර්ෂයේ මෙට්‍රික් ටොන් 43,964 සිට 1992 වර්ෂයේ මෙට්‍රික් ටොන් 34,217 දක්වා සියයට 22 කින් අඩුවීමෙන් සහ කන්තලේ කම්හලේ සීනි නිෂ්පාදනය 1991 වර්ෂයේ මෙට්‍රික් ටොන් 2,558 සිට 1992 වර්ෂයේ මෙට්‍රික් ටොන් 2,387 දක්වා සියයට 7 කින් පහත වැටීමෙනි. කෙසේ වුවද, පසුගිය වර්ෂයට සාපේක්ෂව, සලකා බලන වර්ෂය තුළ සෙවනගල කම්හලේ නිෂ්පාදනය සියයට 27 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 13,576 ක් වූ අතර, හිඟුරාණ කම්හලේ නිෂ්පාදනය සියයට 2 ක සුළු වැඩිවීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 9,520 ක් විය.

වසර දෙකක නිෂ්පාදන වර්ධනයක් වාර්තා කිරීමෙන් පසු 1992 දී පැල්වත්ත කම්හලෙහි සීනි නිෂ්පාදනය පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 1991 වසරේදී මුළු සීනි නිෂ්පාදනයට සියයට 66 කින් දායකවූ පැල්වත්ත සීනි කම්හලෙහි නිෂ්පාදනය 1992 වසරේදී සියයට 57 දක්වා පහත වැටුණි. නොකඩවා වසර තුනකම නිෂ්පාදන වර්ධනයක් වාර්තා කළ සෙවනගල කම්හල 1992 වසරේදී මුළු සීනි නිෂ්පාදනයෙන් සියයට 23 කට දායක විය.

මිරිකීම පිණිස ලැබුණ උක්දඬු ප්‍රමාණය ඉහළයාම මෙන්ම සීනි ලබා ගැනීමේ අනුපාතිකය වැඩිවීම යන කරුණු දෙක හේතුවෙන්, සෙවනගල කම්හලෙහි නිෂ්පාදනය වැඩිවීමක් දක්නට ලැබුණි. වසර තුළ සීනි ලබා ගැනීමේ අනුපාතිකය ඉහළයාමක් පෙන්නුවද, මිරිකනු ලැබීම පිණිස ලැබුණ උක්දඬු ප්‍රමාණය අඩුව පැවතීම නිසා පැල්වත්ත කම්හලෙහි සීනි නිෂ්පාදනය අඩුවිය. 1992 වසරේ මිරිකීම සඳහා ලබාගත් උක්දඬු ප්‍රමාණය සැලකියයුතු ලෙස සියයට 27 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 409,727 ක් විය. පසුගිය වර්ෂය සමඟ සසඳන කළ හිඟුරාණ සහ කන්තලේ කම්හල්වල සීනි ලබා ගැනීමේ අනුපාතිකය පහත වැටුණි. කෙසේ වුවද, 1991 වසරෙහි සියයට 7.81 ක්ව පැවති සීනි කම්හල් හතරෙහිම සීනි ලබා ගැනීමේ අනුපාතිකය 1992 වසරේදී සියයට 8.17 දක්වා වර්ධනය විය. නොකඩවා තුන්වන වසරටත් වැඩිම සීනි ලබා ගැනීමේ අනුපාතිකය සෙවනගල කම්හල වාර්තා කරන ලදි. 1991 දී වැඩිම සීනි ලබා ගැනීමේ අනුපාතිකය වූ සියයට 8.63 ක් වාර්තා කළ සෙවනගල කම්හල 1992 වර්ෂයේදී සියයට 9.23 දක්වා ඉහළ නැගුණි.

සීනි සමාගම් හතර විසින් බිම් කට්ටිකරුවන්ද ඇතුළුව පාලනය කෙරුණු උක් වගාව යටතේ තිබූ බිම් ප්‍රමාණය (නිරිවගාවද ඇතුළුව) හෙක්ටයාර 14,517 දක්වා සියයට 12 කින් වැඩි විය. පසුගිය වසර තුළදී සෙවනගල කම්හල යටතේ උක් වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 44 කින් වැඩි වූ අතර, 1992 වර්ෂයේදී එය තවදුරටත් සියයට 33 කින් වැඩි වී හෙක්ටයාර 3,777 ක් විය. පැල්වත්ත කම්හල යටතේ තිබූ උක් වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 6,007 දක්වා සියයට 5 කින් වැඩිවිය.

කම්හල් හතරෙහි උක්දඬුවල සමස්ත සාමාන්‍ය ඵලදාව සියයට 17 කින් අඩු වී මෙට්‍රික් ටොන් 48.7 ක් විය. හිඟුරාණ කම්හල හැර, අනිකුත් කම්හල් තුන වන පැල්වත්ත, සෙවනගල සහ කන්තලේ යටතේ ඇති උක් වගාවන්හි හෙක්ටයාරයකට සාමාන්‍ය ඵලදාව සියයට 21 කින්, සියයට 23 කින් සහ සියයට 31 කින් පහත වැටුණි. හිඟුරාණ කම්හල යටතේ ඇති උක් වගාවන්හි හෙක්ටයාරයකට සාමාන්‍ය ඵලදාව, පසුගිය වර්ෂය සමඟ සසඳන කළ සියයට 5 කින් වැඩි විය.

සීනි කම්හල් හතර විසින් උක් දඬු කපා ගන්නා ලද මුළු බිම් ප්‍රමාණය 1992 වසරේදී සැලකිය යුතු ලෙස සියයට 27 කින් වැඩි වී හෙක්ටයාර 10,531 ක් විය. සෙවනගල, කන්තලේ

## 1.13 සංඛ්‍යා සටහන

## සීනි නිෂ්පාදන අංශය පිළිබඳ සංඛ්‍යා 1991 - 1992

| ශීර්ෂය | ඒකකය | හිඟුරාණ සීනි කම්හල | | කන්තලේ සීනි කම්හල | | සෙවනගල සීනි කම්හල | | පැල්වත්ත සීනි කම්හල | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1991 | 1992 (අ) | 1991 | 1992 (අ) | 1991 | 1992 (ආ) | 1991 | 1992 (ආ) | 1991 | 1992(ආ) |
| 1. උක් වගාකළ මුළු බිම් ප්‍රමාණය(අ) (නිරි වගාව ඇතුළුව) | හෙක්ටයාර | 2,396 | 2,538 | 1,988 | 2,195 | 2,845 | 3,777 | 5,707 | 6,007 | 12,936 | 14,517 |
| 2. උක් දඬු කපාගත් බිම් ප්‍රමාණය(අ) | හෙක්ටයාර | 1,811 | 1,867 | 923 | 1,333 | 1,335 | 2,090 | 4,220 | 5,241 | 8,289 | 10,531 |
| 3. කපාගත් උක් දඬු ප්‍රමාණය (අ) | මෙට්‍රික් ටොන් | 89,043 | 96,419 | 34,894 | 34,912 | 121,702 | 146,207 | 238,086 | 234,968 | 483,725 | 512,506 |
| 4. පෞද්ගලික අංශයෙන් මිළට ගත් උක් දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 45,896 | 42,995 | 6 | - | 661 | 848 | 320,536 | 174,759 | 367,099 | 218,602 |
| 5. අඹරන ලද උක් දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 134,939 | 139,414 | 34,900 | 34,912 | 122,363 | 147,055 | 558,622 | 409,727 | 850,824 | 731,108 |
| 6. සාමාන්‍ය ඵලදාව (අ) | හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් | 49.17 | 51.64 | 37.80 | 26.19 | 91.16 | 69.96 | 56.42 | 44.83 | 58.36 | 48.67 |
| 7. නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය (ආහාර කොමසාරිස්ගෙන් ලබාගත් අපතේ යන සීනිවලින් කළ නිෂ්පාදන හැර) | මෙට්‍රික් ටොන් | 9,374 | 9,520 | 2,558 | 2,387 | 10,554 | 13,575 | 43,964 | 34,217 | 66,450 | 59,700 |
| 8. සීනි ලබාගැනීමේ ප්‍රතිශතය | % | 6.94 | 6.83 | 7.33 | 6.84 | 8.63 | 9.23 | 7.87 | 8.35 | 7.81 | 8.17 |

(අ) කේන්ද්‍රීය වගාවන් සහ බිම් කට්ටිකරුවන් සතු වගාවන්ද ඇතුළත් වේ.

(ආ) තාවකාලික.

මූලයන්: සීමාසහිත කන්තලේ සීනි කම්ාන්තායාතනය;
සීමාසහිත හිඟුරාණ සීනි කම්ාන්තායතනය;
සීමාසහිත සෙවනගල සීනි කම්ාන්තායතනය;
සීමාසහිත පැල්වත්ත සීනි කම්ාන්තායතනය;

සහ පැල්වත්ත යන කම්හල් යටතේ උක් දඬු කපා ගන්නා ලද බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 57 කින්, සියයට 44 කින් සහ සියයට 24 කින් වැඩි වී හෙක්ටයාර 2,090 ක්, හෙක්ටයාර 1,333 ක් සහ හෙක්ටයාර 5,241 ක් විය.

සීනි කම්හල් හතර මගින් උක් කපාගන්නා ලද මුළු බිම් ප්‍රමාණය සැලකියයුතු ලෙස වර්ධනය වූ නමුත් කපා ගත් උක් දඬු ප්‍රමාණය සියයට 6 කින් පමණක් වැඩිවී මෙට්‍රික් ටොන් 512,506 ක් විය. 1991 දී සෙවනගල කම්හල මගින් කපා ගත් උක්දඬු ප්‍රමාණය සියයට 6 කින් වැඩිවූ අතර, 1992 දී එය තවදුරටත් සියයට 20 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 146,207 විය. පැල්වත්ත කම්හලෙහි අස්වැන්න කපා ගන්නා ලද බිම් ප්‍රමාණය සියයට 24 කින් වැඩි වුවද, කපා ගන්නා ලද උක්දඬු ප්‍රමාණය සියයට 1 කින් අඩුවී මෙට්‍රික් ටොන් 234,968 ක් විය.පැල්වත්ත කම්හල විසින් කපා ගන්නා ලද උක්දඬු ප්‍රමාණය පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ දැඩි නියං තත්ත්වයෙන් ඇති කරන ලද බලපෑමයි. හිඟුරාණ කම්හල විසින් කපා ගන්නා ලද උක්දඬු ප්‍රමාණය සියයට 8 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 96,419 ක් වූ අතර, කන්තලේ කම්හල විසින් කපා ගන්නා ලද උක්දඬු ප්‍රමාණය සුළු වශයෙන් වැඩි වී මෙට්‍රික් ටොන් 34,912 ක් විය.

1990 දී හා 1991 දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ, පෞද්ගලික වගාකරුවන් විසින් කම්හල්වලට සපයන ලද, උක්දඬු ප්‍රමාණය 1992 දී සියයට 40 ක පහත වැටීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 218,602 විය. සෙවනගල කම්හල විසින් පෞද්ගලික වගා කරුවන්ගෙන් මිලදී ගත් උක්දඬු ප්‍රමාණය සියයට 28 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 848 ක් වූ අතර, පැල්වත්ත කම්හල විසින් මිලදී ගත් උක්දඬු ප්‍රමාණය සැලකියයුතු ලෙස සියයට 45 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 174,759 ක් විණි. 1992 දී හිඟුරාණ කම්හල මගින් පුද්ගලික වගාකරුවන්ගෙන් මිලදී ගන්නා ලද උක්දඬු ප්‍රමාණයද සියයට 6 කින් අඩු වී මෙට්‍රික් ටොන් 42,995 ක් විය. කම්හල් 4 විසින්ම මිලදී ගත් සමස්ත උක්දඬු ප්‍රමාණයෙන් සියයට 80 ක ප්‍රමාණයක් පැල්වත්ත කම්හල විසින් මිලදී ගෙන තිබුණි.

## අතුරු ආහාර බෝග

අර්තාපල්, මිරිස් සහ ළූනු වැනි වැඩි ආදායම් ලබන බෝග කීපයක් පමණක් වාරිමාර්ග වලින් පෝෂිත ප්‍රදේශ වල වගා කරනු ලැබේ. අනෙකුත් අතුරු ආහාර බෝග වලින් වැඩි ප්‍රමාණයක් වර්ෂා ජලයෙන් පෝෂණය වන විසිර පවතින කුඩා බිම් කොටස් වල හෝ ගෙවතු වල වගා කරනු ලැබේ. මේ නිසා අතුරු ආහාර බෝග වගා කරනු ලබන බිම් ප්‍රමාණය හෝ ඒවායේ නිෂ්පාදනය පිළිබඳව විශ්වාසදායක දත්තයන් රැස්කිරීම ඉතාමත් අපහසු වී ඇත. එහෙයින්, අතුරු ආහාර බෝග වල ක්‍රියාකාරීත්වය තාවකාලික ඇස්තමේන්තු මත පදනම් වේ.

කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සපයන ලද දත්තයන්ට අනුව, 1992 අතුරු ආහාර බෝග වල ක්‍රියාකාරිත්වය තරමක් මිශ්‍ර ප්‍රතිඵල පෙන්නුම් කරයි. පසුගිය වසරෙහි නිෂ්පාදනය සමඟ සසඳා බලන කළ, ලොකු ළූනු, රතු ළූනු, කුරක්කන් සහ අර්තාපල් නිෂ්පාදනයේ වැඩිවීමක් වාර්තා කළ අතර ඒවා පිළිවෙලින් සියයට 28 ක්, සියයට 13 ක්, සියයට 10 ක් සහ සියයට 9 ක් විය. මෙම නිෂ්පාදනයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෙම බෝග වගා කරන ලද බිම් ප්‍රමාණය පුළුල් වීමය.

මේ අතර, විමසුමට භාජනය වන වර්ෂය තුළදී මුං ඇට, සෝයා බෝංචි, මිරිස්, තල සහ උඳු නිෂ්පාදනයේ අඩුවීමක් සිදුවූ අතර, පිළිවෙලින් සියයට 35 ක්, සියයට 30 ක්, සියයට 29 ක්, සියයට 28 ක් සහ සියයට 19 ක් විය. මෙම සැලකිය යුතු අඩුවීමට සාමාන්‍ය ඵලදාව මෙන්ම වගා කළ බිම් ප්‍රමාණයේ අඩුවීමද හේතු විය.

1992 දී අතුරු ආහාර බෝග අංශය සඳහා පොහොර නිකුත් කිරීම සියයට 14 කින් අඩුවී මෙට්‍රික් ටොන් 43,600 ක් විය.

1992 වර්ෂයේදී ද තෝරා ගන්නා ලද අතුරු ආහාර බෝග 9 ක් සඳහා වී අලෙවි මණ්ඩලය විසින් පදනම් මිල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදි. මෙම පදනම් මිල, පසුගිය වසරේදී පැවති මට්ටමෙහිම නොවෙනස්ව පැවතුණි.

පසුගිය වර්ෂය සමඟ සසඳා බලන කල, 1992 දී වී අලෙවි මණ්ඩලය මගින් මිළ දී ගත් බඩ ඉරිඟු ප්‍රමාණය සියයට 47 කින් අඩුවී මෙට්‍රික් ටොන් 49 ක් විය. මේ අතර,

## 1.14 සංඛ්‍යා සටහන

### අතුරු ආහාර බෝග සඳහා පදනම් මිල යෝජනා ක්‍රමය

(කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල්)

| බෝගය | | 1992 ජනවාරි 1 වැනිදා සිට 1992 දෙසැම්බර් 31 දක්වා |
|---|---|---|
| බඩ ඉරිඟු | .. | 5.25 |
| කුරක්කන් | .. | 5.00 |
| රට කජු (පොතු සහිත) | .. | 8.15 |
| සෝයා බෝංචි | .. | 7.30 |
| තල | | |
| කලු | .. | 8.00 |
| සුදු | .. | 9.90 |
| වියළි මිරිස් | | |
| මිරිස් 1 | .. | 32.00 |
| මිරිස් 11 | .. | 30.00 |
| කව්පි | .. | 9.00 |
| මුං ඇට | .. | 12.00 |
| උඳු | .. | 7.50 |

මූලය: කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය.

සමූපාකාර තොග වෙළඳ සංස්ථාව (සතොස) මිළදී ගත් අර්තාපල් ප්‍රමාණය 1991 දී මෙට්‍රික් ටොන් 2 සිට 1992 දී මෙට්‍රික් ටොන් 73 දක්වා වැඩි වූ අතර, මිළදී ගත් ලොකු ළූණු ප්‍රමාණය තුන් ගුණයකින් වැඩි වී මෙට්‍රික් ටොන් 4,401 ක් විය. 1992 ස.තො.ස මගින් මිළදී ගත් මුං ඇට ප්‍රමාණය සියයට 29 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 2,824 ක් විය. මිරිස් නිෂ්පාදනය අඩුවීම හේතුවෙන්, ස.තො.ස. 1992 දී වියළි මිරිස් මෙට්‍රික් ටොන් 6,985 ක් ආනයනය කරන ලදි. මේ අතර, දේශීය ලොකු ළූනු නිෂ්පාදනය වැඩිවීම නිසා 1992 දී ස.තො.ස. ආනයනය කළ ලොකු ළූනු ප්‍රමාණය සියයට 27 කින් අඩුවී මෙට්‍රික් ටොන් 35,507 ක් විය.

## ධීවර සහ පශු නිෂ්පාදනය

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් තාවකාලිකව ගණන් බලා ඇති පරිදි 1992 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 206,168 ක් විය. මෙය පසුගිය වර්ෂය සමඟ සසඳන විට සියයට 4 ක වැඩිවීමකි. නැගෙනහිර පළාතේ ආරක්ෂක තත්ත්වයේ වැඩි දියුණුවත්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වැඩි වශයෙන් බහු දින බෝට්ටු ප්‍රයෝජනයට ගනිමින් සහ කෘෂිකාර්මික පුනරුත්ථාපන ණය ක්‍රමය යටතේ මුදා හළ ණය ඇතුළුව විවිධ සහනාධාර ක්‍රම මගින් කළ සහනාධාර ගෙවීම් වල සැලකියයුතු වැඩිවීම යන සංවර්ධන කටයුතු මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

මුළු මත්ස්‍ය නිෂ්පාදනයට සියයට 79 කින් දායක වන වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය 1991 වර්ෂයේ මෙට්‍රික් ටොන් 159,151 ක සිට 1992 වර්ෂයේ මෙට්‍රික් ටොන් 163,168 දක්වා වැඩි විය. දියඹ ධීවර අනු අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 46 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 22,000 ක් විය. මීට වෙනස්ව යමින්, මිරිදිය මත්ස්‍ය නිමැවුම් අංශය සියයට 12 කින් අඩු වී මෙට්‍රික් ටොන් 21,000 ක් විය. කලින් වර්ෂවලදී මෙන්ම පෞද්ගලික අංශය මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් විශාලතම කොටසට දායක විය. ලංකා ධීවර සංස්ථාවේ මුළු මත්ස්‍ය සැපයුම කලින් වර්ෂයට වඩා සියයට 2 ක අඩුවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 1,893 ක් ලෙස

ඇස්තමේන්තු කර ඇත. ලංකා ධීවර සංස්ථාවේ අයිස් නිෂ්පාදනය 1991 වර්ෂයේ නිමැවුමට වඩා සියයට 16 කින් අඩු වී මෙට්‍රික් ටොන් 5,032 ක් විය.

1992 වර්ෂයේ විශේෂ ධීවර සංවර්ධන ව්‍යාපෘති කීපයක් හා සම්බන්ධ කටයුතු තව දුරටත් කරගෙන යන ලදි. මේවාට නැගෙනහිර වෙරළ මත්ස්‍ය සංවර්ධන ව්‍යාපෘතිය සහ බටහිර වෙරළ මත්ස්‍ය සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළත් වේ.

අළුත් බෝට්ටු සහ සම්ප්‍රදායික යාත්‍රා අළුත් වැඩියා කිරීම සඳහා 1991 වර්ෂයේ මුහුදු ධීවර අංශයට දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 33 සමග සසඳන විට 1992 වර්ෂයේ දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය සියයට 85 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 61 ක් විය. විවිධ සහනාධාර ක්‍රම යටතේ 1992 වර්ෂයේ බෝට්ටු 779 ක් ද, සාම්ප්‍රදායික යාත්‍රා 1,614 ක් ද මුහුදු ධීවර අංශය සඳහා නිකුත් කරන ලදි. වර්ෂය තුළ දී ප්‍රධාන වශයෙන් ධීවර සමුපකාර සමිති මගින් ධීවර කළමනාකාරිත්ව කටයුතු වැඩි දියුණු විය. 1992 වර්ෂයේදී පිහිටුවා ගන්නා ලද ධීවර සමුපකාර සමිති ප්‍රමාණය සියයට 2 කින් වැඩි වී 806 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුළු සාමාජික සංඛ්‍යාව 1991 වර්ෂයේ 75,000 සිට 1992 වර්ෂයේ 83,627 දක්වා වැඩිවිය. නිෂ්පාදන මට්ටම වැඩි වුවද සියළුම මත්ස්‍ය වර්ගවල සාමාන්‍ය මිලද 1992 වර්ෂය තුළදී වැඩිවිය.

## 1.15 සංඛ්‍යා සටහන

## මත්ස්‍ය නිෂ්පාදනය 1988 - 1992

මෙට්‍රික් ටොන්

| අනු අංශය | 1988 | 1989 | 1990 | 1991 | 1992(අ) |
|---|---|---|---|---|---|
| මුහුදු බඩ | 155,099 | 157,411 | 134,132 | 159,151 | 163,168 |
| ගැඹුරු මුහුද හා දියඹ | 4,425 | 8,155 | 11,666 | 15,080 | 22,000 |
| මිරිදිය | 38,012 | 39,720 | 31,265 | 23,832 | 21,000 |
| එකතුව | 197,536 | 205,286 | 177,063 | 198,063 | 206,168 |

(අ) තාවකාලික. මූලය: ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, කිලිනොච්චිය, මන්නාරම, වවුනියාව, මුලතිව් හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක හැර අනිකුත් දිස්ත්‍රික්කවල කිරි නිෂ්පාදනය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 8 කින් වැඩි වී 1992 වර්ෂයේදී ලීටර් දශලක්ෂ 302 ක් විය. 1991 වර්ෂය සමග සසඳන විට සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගම (මිල්කෝ) මගින් රැස් කළ කිරි ප්‍රමාණය සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1992 වර්ෂයේදී ලීටර් දශලක්ෂ 49 ක් විය. ඊට වෙනස්ව යමින්, සීමාසහිත නෙස්ලේ ලංකා සමාගම මගින් රැස් කළ කිරි ප්‍රමාණය 1991 වර්ෂයට වඩා සියයට 30 කින් සැලකියයුතු ලෙස අඩුවී ලීටර් දශලක්ෂ 34 ක් වාර්තා කළේය. කිරි ලීටරයක නිෂ්පාදන මිල 1992 වර්ෂයේදී ද ලීටරයක් රු. 8.50 ක් ලෙස නොවෙනස්ව පැවතිණ.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික දත්තයන්ට අනුව, 1992 වර්ෂයේ බිත්තර නිෂ්පාදනය (කිලිනොච්චි, මන්නාරම, වවුනියාව, මුලතිව් හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක හැර) දශලක්ෂ 794 ක් ලෙස ගණන් බලා ඇති අතර මෙය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 1 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි.

ප්‍රධාන සත්ව ආහාර නිෂ්පාදන සමාගම් විසින් සපයා ඇති තාවකාලික දත්තවලට අනුව, 1992 වර්ෂයේදී මුළු සත්ව ආහාර නිෂ්පාදනය සියයට 33 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 179,647 ක් විය. ඒ සඳහා පශු නිෂ්පාදන කර්මාන්ත ප්‍රසාරණය නිසා සිදු වූ වැඩි ඉල්ලුම හේතු විය.

පොහොර

1992 වර්ෂයේදී විවිධ බෝග අංශයන් සඳහා නිකුත් කරන ලද මුළු පොහොර ප්‍රමාණය, පසුගිය වර්ෂය සමඟ සසඳන කළ සියයට 1 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 459,400 ක් විය. මුළු පොහොර නිකුත් කිරීම් වලින් සියයට 42 ක් වන විශාලතම කොටසට දායක වූ වී වගා අංශය සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය සියයට 8 කින් වැඩි විය. විමසුමට භාජනය වන කාලච්ඡේදය තුළදී පොල් වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය සියයට 17 කින් වැඩි විණි. ඊට වෙනස්ව යමින් තේ, රබර්, අතුරු ආහාර බෝග සහ සුළු අපනයන බෝග යන වගා අංශ සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 8 ක්, සියයට 7 ක්, සියයට 14 ක් සහ සියයට 35 ක් දක්වා පහත වැටුණි.

## 1.16 සංඛ්‍යා සටහන

## බෝග අනුව පොහොර නිකුත් කිරීම 1989 - 1992

මෙට්‍රික් ටොන් දහස්

| | බෝගය | 1989 | 1990 | 1991 | 1992 (අ) |
|---|---|---|---|---|---|
| 1. | වී | 238.1 | 161.2 | 179.3 | 193.3 |
| 2. | තේ | 127.9 | 134.1 | 118.9 | 108.8 |
| 3. | රබර් | 22.6 | 22.2 | 13.7 | 12.7 |
| 4. | පොල් | 38.5 | 23.6 | 28.8 | 33.8 |
| 5. | අතුරු ආහාර බෝග | 28.7 | 46.3 | 50.7 | 43.7 |
| 6. | සුළු අපනයන බෝග | 5.6 | 7.6 | 11.1 | 7.2 |
| 7. | අනෙකුත් | 60.9 | 42.1 | 51.2 | 59.9 |
| | එකතුව | 522.3 | 437.1 | 453.7 | 459.4 |

(අ) තාවකාලික

මූලය: පොහොර ලේකම් කාර්යාලය.

සීමාසහිත ජනතා පොහොර ව්‍යවසාය සහ සීමාසහිත ලංකා පොහොර සමාගම යන රාජ්‍ය ආයතන විසින් පොහොර අඩු ප්‍රමාණයක් නිකුත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1992 වර්ෂය තුළදී මුළු පොහොර නිකුත් කිරීම් වලින් සියයට 66 කට දායක වූ රාජ්‍ය අංශය මගින් නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 301,542 දක්වා සියයට 14 කින් අඩු විය. එයට වෙනස්ව යමින්, වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ තොග වෙළෙන්දන් විසින් නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය පස් ගුණයකින් වැඩිවී, මෙට්‍රික් ටොන් 157,841 ක් ලෙස වාර්තා විය.

ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් සපයන ලද දත්තයන්ට අනුව, 1992 වර්ෂය තුළදී ආනයනය කරන ලද මුළු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 369,619 ක් විය. එය 1991 වර්ෂයට වඩා සියයට 4 ක අඩුවීමකි. පසුගිය වසර තුළ ප්‍රධාන පොහොර ආනයනකරුවා වශයෙන් රඳවාගෙන තිබූ ස්ථානය තවදුරටත් රැකගනිමින් 1992 දීද සීමාසහිත ලංකා පොහොර සමාගම නොකඩවා එම තත්ත්වය පවත්වා ගන්නා ලදි. ඉතා ජනප්‍රියව පවතින පොහොර වර්ගයක් වූ යූරියා පොහොර ආනයනය 1992 වසරේදී සැළකිය යුතු ලෙස සියයට 28 කින් අඩුවී මෙට්‍රික් ටොන් 130,860 ක් විය. 1992 වර්ෂය තුළ ආනයනය කරන ලද සල්ෆේට් ඔෆ් ඇමෝනියා පොහොර ප්‍රමාණය සුළු වශයෙන් අඩුවී මෙට්‍රික් ටොන් 92,565 ක් වූ අතර, මියුරියේට් ඔෆ් පොටෑෂ් ආනයනය මෙට්‍රික් ටොන් 76,084 දක්වා සියයට 16 කින් ඉහළ නැගුණි.

පොහොර මිල ගණන් වර්ෂය පුරා ස්ථාවර මට්ටමක පැවතුනි. වර්ෂය ආරම්භයේදී තොග වෙළෙඳුන් සතුව පැවති මුළු පොහොර තොගය, මෙට්‍රික් ටොන් 147,029 ක සිට 1992 දෙසැම්බර් 31 දින දී මෙට්‍රික් ටොන් 92,821 දක්වා අඩු විය. වර්ෂය අවසානයේ තොග

තත්ත්වය පහත වැටීමට හේතු වූයේ පොහොර ආනයනය අඩුව තිබියදීත්, පොහොර නිකුත් කිරීම් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

## 1.17 සංඛ්‍යා සටහන

## පොහොර තොග නිකුතුව 1991 - 1992

| අංශය | 1991 | | 1992 (අ) | | |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ.ටොන්) | ප්‍රතිශතය | ප්‍රමාණය (මෙ.ටොන්) | ප්‍රතිශතය | ප්‍රමාණයෙහි වෙනස්වීම් ප්‍රතිශතය |
| 1. රාජ්‍ය අංශය | **349,149** | **78** | **285,307** | **62** | **- 19.9** |
| 1.1 සීමාසහිත ලංකා පොහොර සමාගම | (201,262) | (45) | (166,655) | (36) | - 17.2 |
| 1.2 සීමාසහිත ජනතා පොහොර ව්‍යවසාය | (101,187) | (21) | (68,671) | (15) | - 32.1 |
| 1.3 සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | (53,772) | (12) | (49,981) | (11) | - 7.1 |
| 2. පෞද්ගලික අංශය | 96,650 | 22 | 174,076 | 38 | + 78.4 |
| 2.1 ඒ. බවර් සහ සමාගම | (49,538) | (11) | (60,528) | (13) | + 22.2 |
| 2.2 වෙනත් | (47,112) | (11) | (113,548) | (25) | +136.5 |
| එකතුව | 453,770 | 100 | 459,383 | 100 | + 1.2 |

(අ) තාවකාලික

මූලය: ජාතික පොහොර ලේකම් කාර්යාලය